# ජාතික තරගකාරී ලංසු කැඳවීම

## අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ලංසු අංකය : EPD/F08/02/2024**

# 2025 වර්ෂය සඳහා පාසල් පෙළපොත් මුද්‍රණය කිරීම

අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙනුවෙන් අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් විසින් 2025 වර්ෂයට අවශ්‍ය පාසල් පෙළපොත් මුද්‍රණය කර නියමිත ගබඩා වෙත සැපයීම සඳහා සුදුසුකම්ලත් ධාරිතාව හා හැකියාව ඇති මුද්‍රණකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. මෙම ලංසු කැඳවීමට අදාළ සියලුම පොත් ඕෆ්සෙට් මුද්‍රණ ක්‍රමයට පමණක් මුද්‍රණය කරනු ලබන බැවින් ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රය ඇති මුද්‍රණ ක්ෂේත්‍රයේ පසුගිය වසර 05ක කාලයක් තුළ වසර 03ක පළපුරුද්දක් සහ ඕෆ්සෙට් මුද්‍රණ කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ඇති මුද්‍රණකරුවන් පමණක් මේ සඳහා ඉදිරිපත් විය යුතුය.

03. පසුගිය වර්ෂ 02 ඇතුළත එක් වර්ෂයක හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මුද්‍රණ ඇණවුම් ලබා ගිවිසුම්වලට එළඹීමෙන් පසු ගිවිසුම් පරිදි පෙළපොත් මුද්‍රණය කර භාර නොදුන් මුද්‍රණකරුවන් මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි.

04. ලංසු ලියකියවිලි ලබා ගැනීම සඳහා පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතු වේ.

I. රු. 100,000/- ක ආපසු නොගෙවන ගාස්තුවක් අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් වෙත මුදලින් ගෙවූ බවට ලබා දෙන ලදුපත.

II. රජයේ දෙපාර්තමේන්තුවක් වශයෙන් මුද්‍රණ කටයුතු කරන ආයතන හා පාර්ලිමේන්තු පනතකින් ආරම්භ කර මුද්‍රණ කටයුතු කරන ආයතන හැර අනෙකුත් ලංසුකරුවන් ව්‍යාපාරයේ සාමාන්‍ය ස්වභාවය ලෙස මුද්‍රණ කටයුතු දක්වමින් සමාගම් රෙජිස්ට්‍රාර් / පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් / ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලැබ ඇති ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ නීතිඥවරයකු හෝ ලවා සහතික කරන ලද පිටපතක්.

III. 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව ටෙන්ඩර්කරුවකු සඳහා හෝ වෙනුවෙන් හෝ අනුයෝජිතයකු, උපඅනුයෝජිතයකු, නියෝජිතයෙකු හෝ නාමිකයකු හෝ වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපත.

IV. ලංසු ඉදිරිපත් කරන අවස්ථාව වන විට ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර සහිත ක්‍රියාකාරී තත්ත්වයේ පවතින මුද්‍රණාලයක් ආයතනය සතුව තිබෙන බවට සිය මුද්‍රණාලය පිහිටි බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ලබා ගන්නා ලද සහතිකය.

V. මුද්‍රණ ආඥා පනතේ 2 (1) වගන්තිය ප්‍රකාරව මහේස්ත්‍රාත්වරයකුගෙන් ලබා ගනු ලැබූ සහතිකයේ සාමදාන විනිශ්චයකාරවරයකු / නීතිඥයකු විසින් සහතික කරන ලද පිටපතක්.

05. ලංසු ඉදිරිපත් කළ යුත්තේ බත්තරමුල්ල, පැලවත්ත, 'ඉසුරුපායේ' 6 වන මහලේ පිහිටි අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ලංසු ලියවිලිවල පමණි.

06. ලංසු ලියවිලි 2024.06.28 දින සිට 2024.07.18 දින දක්වා සතියේ රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා බත්තරමුල්ල, පැලවත්ත, 'ඉසුරුපායේ', 6 වන මහලේ පිහිටි අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබාගත හැකිය. මේ සඳහා 04 ඡේදයේ සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

07. මුද්‍රා තබන ලද ලංසු ලියවිලි 2024.07.19 වන දින පෙ.ව. 10.00 ට පෙර බත්තරමුල්ල, පැලවත්ත, 'ඉසුරුපාය', 6 වන මහලේ පිහිටි අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ එදිනට පෙර ලැබෙන සේ සභාපති, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ එවිය යුතුය. ලංසු බහා ඉදිරිපත් කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **'2025 වර්ෂය සඳහා පාසල් පෙළපොත් මුද්‍රණය'** යන්න සඳහන් කර තිබිය යුතුය. 2024.07.19 පෙ.ව. 10.00 ට ලංසු භාර ගැනීම අවසන් කළ වහාම ලංසු විවෘත කිරීම ආරම්භ කරන අතර, එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් දෙදෙනෙකුට හෝ සහභාගි විය හැකිය.

08. ඉහත ලිපිනයේ පිහිටි අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ දී මුදල් ගෙවීමකින් තොරව 2024.06.28 දින සිට 2024.07.18 දින දක්වා සතියේ රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලියවිලි පරීක්ෂා කර බැලිය හැකි ය.

09. ලංසු ඉදිරිපත් කරන්නන්ට පැන නගින ගැටලු නිරාකරණය කිරීම පිණිස ලංසු ඉදිරිපත් කරන්නන්ගේ පූර්ව ලංසු රැස්වීම 2024.07.08 දින පෙ.ව. 10.00 ට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ දී අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

10. ලංසු ඉදිරිපත් කරන්නන් විසින් ලංසු ලියවිලිවල ඇමුණුම් ix හි සඳහන් කර ඇති පරිදි ලංසුව සමග ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු ය.

11. ලංසු වලංගු කාලය ලංසුව විවෘත කළ දින සිට දින 90කි. එනම් 2024.10.16 දින දක්වා විය යුතුය.

12. වැඩිදුර විස්තර පහත සඳහන් අය වෙතින් ලබා ගත හැකිය.

දුරකථන අංක : අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් - 011-2784815

ප්‍රධාන ගණකාධිකාරී - 011-2787515

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,**
**අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,**
**හයවන මහල,**
**'ඉසුරුපාය', පැලවත්ත, බත්තරමුල්ල.**
**2024.06.28**